සමූපකාර සේවක කොමිෂන් සභාව/බ.ප.
චක්‍රලේඛ අංක: 07/2006

මගේ අංකය:- බප/සසේකො/
ලේ.නිර්/2006

සමූපකාර සේවක කොමිෂන් සභාව
(බ.ප.)

අංක: 50, කිතුල්වත්ත පාර,
කොළඹ 08.
2006.06.19

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස.සමිති
සභාපති වරුන් වෙත,

සේවක නිවාඩු ලබාදීම සම්බන්ධව කාර්ය විධි විධාන සංග්‍රහයට
නව කාර්ය විධි විධාන ඇතුලත් කිරීම – 2 වන පරිච්ඡේදය
2:11 හා 2:12 උපඡේද

1972 අංක 12 දරණ සමූපකාර සේවක කොමිෂන් සභා පනත යටතේ සම්පාදිත රෙගුලාසි මාලාවේ 67 වන වගන්තිය කෙරෙහි ඔබේ අවධානය මෙයින් යොමු කරවමි.

02. එහි සඳහන් වර්ගයන්ට අයත්වෙන සේවකයින් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් සේවා කොන්දේසි නිකුත් කරනු ලබයි. ඔවුන් පාලනය විය යුත්තේ එකී සේවා කොන්දේසි යටතේය.

03. ඒ අනුව කාර්යය විධි විධාන සංග්‍රහයේ 2 වන පරිච්ඡේදය මගින් නිවාඩු පිළිබඳ උපදෙස් නිකුත්කර ඇත. ඊට අමතරව පහත සඳහන් නියමයන්ද නිකුත් කරනු ලැබේ.

2:11:1 නවක සේවකයන් සඳහා නිවාඩු

සේවකයිනට හිමි නිවාඩු තීරණය කිරීම ඔවුන්ට අදාල වර්ෂයේ සේවය කිරීමට නියමිත ඉදිරි කාල සීමාව අනුව අනුපාත කරනු ලබන නිවාඩු දින දින ගණනක් එනම් ප්‍රථම වසරේ ඉදිරි කාලය තුළදී මාස 10 ක් සේවය කිරීමට නියමිත ස්ථිර සේවකයෙකුට අනියම් 07÷12X10 දින 5 5/6 කි.

විවේක නිවාඩු

14÷12X10 = දින 11 2/3 කි. මෙසේ ගණන් කිරීමේදී දින 1/2 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලැබෙන සෑම අවස්ථාවකම එය එක් දිනක් සේ ගණනය කළයුතුය.

04. ඉල්ලා අස්වී යාමේදී ඉල්ලා අස්වීම ක්‍රියාත්මක වන දිනට ඔයකට පෙරාතුව ඇරඹෙන දිනයේ සිට සියළු නිවාඩු හිමිකම් අහෝසි වන්නේය.

2:11:2 විශ්‍රාම පූර්ව නිවාඩු

05. විශ්‍රාම ගැනීමේදී පෙර වර්ෂ 03 ක ඉතිරි අසනීප නිවාඩු සහ විශ්‍රාම ගනු ලබන්නේ එම වසරේ අප්‍රේල් 01 දිනට පෙර නම් එම වසරේ විවේක නිවාඩු වලින් 1/3 ක් ද, ඇතුළත්ව විශ්‍රාම පූර්ව නිවාඩු දිය හැකිය. විශ්‍රාම ගනු ලබන වර්ෂයේ දී ඔහු විවේක නිවාඩු ලබා ගෙන ඇත්නම් එම නිවාඩු දින ගණන අඩු කළයුතුය. අප්‍රේල් මස 01 දින හා ඉන්පසු විශ්‍රාම ගනු ලබනනිලධාරීන් සඳහා පෙර වර්ෂ තුනක XXXX ඉතිරි විවේක නිවාඩු සහ විශ්‍රාම ගනු ලබන වර්ෂයේ ඉතිරි නිවාඩු විශ්‍රාම පූර්ව නිවාඩු වශයෙන් ලබාදිය හැකිය.

## 2:12
## බෝවන රෝග සඳහා විශේෂ නිවාඩු : (වැටුප් සහිත)

2:12:1 මතු සඳහන් වන බෝවන රෝගයන් සඳහා සමූපකාර සේවකයින්ටද වැටුප් සහිතව විශේෂ නිවාඩු ලබා ගත හැක්කේ සමූපකාර සමිතියක ස්ථිර සේවකයකුට පමණි.

2:12:2 සම්පූර්ණ වැටුප් සහිත මෙම විශේෂ නිවාඩු ලබාගත හැක්කේ සාමාන්‍ය නිවාඩු රෙගුලාසි යටතේ සේවකයාට සාමාන්‍යයෙන් හිමිවන පඩි සහිත නිවාඩු අවසන් පසුවය.

2:12:3 මෙකී වැටුප් සහිත විශේෂ නිවාඩු අවසන්වූ පසුව සාමාන්‍ය නිවාඩු රෙගුලාසි යටතේ අදාල සේවකයාට අඩ වැටුප් සහිතව දිය හැකි නිවාඩු සමිතියට අනුමත කල හැකිය.

2:12:4 මෙම විශේෂ නිවාඩු හා අඩ වැටුප් සහිත නිවාඩු ද යන සියල්ල අවසන්වූ පසු අදාල සේවකයා වැටුප් රහිත නිවාඩු ඉල්ලා සිටීමට පුළුවන. එහෙත් මෙවැනි අවස්ථාවක් එළඹුන හොත් එම අවස්ථාවේදී අදාල සේවකයා ගේත් සමිතියේ අනෙකුත් සේවකයන්ගේත් සමිතියේත් යහපත සලකා බලා තවදුරටත් වැටුප් රහිත නිවාඩු දීම යුක්ති සහගතද නැතහොත් අදාල සේවකයා සෞඛ්‍ය හේ මත විශ්‍රාම ගැන්විය යුතු ද යන්න ගැන නියත තීරණයක් දෙන ලෙස සමූපකාර සමිතිය [illegible] වෛද්‍ය මණ්ඩලයෙන් ඉල්ලා සිටිය යුතුය. ඒ අනුව ලැබෙන පිළිතුර අනුව සමිතියට ක්‍රියා කලහැ

2:12:5 වැටුප් සහිතව ලබාගත හැකි මෙකී සෑම විශේෂ නිවාඩු කාලයක් සඳහාම රජයේ වෛද්‍ය මණ්ඩලයකින් නිකුත් කරන ලද වෛද්‍ය වාර්තාවක් සේවකයා විසින් සමිතිය වෙත ඉදිරපත් කල යුතුවේ. එම වාර්තාව මත විශේෂ වැටුප් සහිත නිවාඩු අනුමත කිරීම සමිතිය විසින් නිර්දේශ කරන්නේද යන්න ගැන අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයන්ද සමග අනුමැතිය සඳහා කොමිෂන් සභාව වෙ ඉදිරිපත් කල යුතුය.

2:12:6 යම්කිසි සේවකයෙකු මතු දැක්වෙන බෝවෙන රෝගයකින් පෙලෙන බව දැක්වෙන මුල්ම වෛද්‍ය සහතිකය සේවකයා විසින් සමිතිය වෙත ඉදිරිපත් කල පසුව ඔහුට සුවය ලැබීමට සෑහෙන ප්‍ර ඉඩක් තිබේද යන්න පිළිබඳව තීරණය කර ගනු පිණිස සමිතිය විසින් එකී සේවකයා රජයේ වෛ මණ්ඩලයක් වෙත යොමු කර විය යුතුය. වෛද්‍ය මණ්ඩලය විසින් ඔහුට සුවය ලැබීමට ඉඩක් තිබෙන බැව් වාර්තා කලහොත් ඒ සඳහා නිර්දේශ කරනු ලබන ප්‍රතිකාරද ඔහු විසින් ලබාගන්නා බවට සමිතිය සෑහීමකට පත්විය යුතුය.

2:12:7 මෙකී විශේෂ නිවාඩු සඳහා අදාලවන බෝවන රෝග හා නිවාඩු දියයුතු කාල පරිච්ඡේද පහත දැක්වේ.

| බෝවන රෝගය | නිවාඩු දියයුතු කාල සීමාව. |
|---|---|
| කොළරාව | මෙකී රෝග සඳහා අවශ්‍ය |
| මහාමාරිය | වන නිවාඩු රජයේ වෛද්‍ය |
| පුනරාවර්තන උණ | මණ්ඩලයකින් නිර්දේශ |
| උකුණන්ගෙන් බෝවන | කරනු ලබන දින ගණන් වේ. |
| ටයිෆස් උණ | |
| උකුණන් ගෙන් බෝවන | |
| වසූරිය | |
| කහ උණ | |

2:12:8 ක්ෂය රෝගය, ලාදුරු රෝගය, හා පිළිකා රෝගය යන රෝග වැළඳුන විටෙක සේවකයාට සුවය ලැබෙන බවට සෑහෙන විශ්වාසයක් තැබිය හැකිදැයි රජයේ වෛද්‍ය මණ්ඩලයක් විසින්

වාර්තා කරනු ලැබුව හොත් ඒ සඳහා මතු දැක්වෙන අන්දමට සම්පූර්ණ වැටුප් සහිත විශේෂ නිවාඩු දිය යුතුය.

(අ) ක්ෂය රෝගය

එක් වරකට මාස 09 ක් එක දිගට නිවාඩු දිය හැකිය. මාස 09 අවසානයේදී රෝගය සුව වී සේවයට පැමිණ අවුරුදු 04 කට පසුව යළිත් එක් වතාවක් මාස 03 ක නිවාඩු දිය හැකිය.

(ආ) ලා දුරු රෝගය

මාස 22 කට නොවැඩි කාලයක්

(ඇ) පිළිකා රෝගය

මාස 06 කට නොවැඩි කාලයක්

ජේ. කේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:
1. බස්නාහිර පළාතේ සමූපකාර හා පළාත් මාර්ග අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, සමූපකාර හා පළාත් මාර්ග අමාත්‍යාංශය (බ.ප.)
4. සමූපකාර සංවර්ධන කොමසාරිස් හා රෙජිස්ට්‍රාර් (බ.ප.)
5. සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, කළුතර, ගාල්ල)
6. ලේකම්, සමූපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමූපකාර සේවක කොමිෂන් සභා ලේකම් වරුන්
8. සියළුම වෘත්තීය සමිති සංගම්